

# මුතූ කසාද බැඳලද....?

මුතු තරංගා පහුගිය කාලේ ටිකක් නිහඬ චරිතයක් වෙලා හිටියා. ඇතැම් උත්සව වලදී ඇයව දැක්කත්, නිර්මාණයකින් දකින්න ලැබුනෙම නැති තරම්. ඒත් එක පාරටම කතාවක් පැතිරුනා 'මුතූ කසාද බැඳලා' කියලා.

**මුතු කාටවත් නොකියාම විවාහ වුනා කියලා ආරංචි වුනා.**

අනේ නැහැ, මගේ ෆේස්බුක් පේජ් එකේ දාලා තිබුන ෆොටෝස් වගයක් නිසා වෙන්නැති ඔය ආරංචිය යන්න ඇත්තෙ, මනාලියන් දැක්මකට මං පහුගිය දවසක පෙනී හිටියෙ උඩරට මනාලියක් විදියට ඇඳලා. ඒ ෆොටෝස් මං ෆේස්බුක් දැම්මා.

**හැබෑ ජීවිතේ මනාලියක් වෙන්න කැමැත්තක් නැද්ද?**

අනේ ඇයි එහෙම අහන්නෙ, හැම කෙල්ලෙක්ම කැමතියි ලස්සන මනාලියක් වෙලා, ලස්සන පවුල් ජීවිතයක් ගෙවන්න.



**අපි දන්න තරමින් මුතුට පෙම්වතෙක් ඉන්නවා, ඒක වසර ගණනාවක ආදර කතාවක්. ඉතින් මනාලියක් වෙන්න මෙච්චර පරක්කු ඇයි?**

සමහර වෙලාවට මටත් එහෙම නොහිතෙනවා නෙවෙයි, ඒත් හැමදේම සිද්ධ වෙන්නෙ දෛවය අනුව, සුදුසු කාලෙට මගේ විවාහය සිද්ධ වෙයි.

**රඟපෑමෙන් අයින් වෙලාද පේන්නෙ නැත්තේ?**

අනේ නැහැ, ඒත් පොඩි තෝරා බේරා ගැනීමක් කරලා මගේ වටිනාකමත් එක්ක ලැබෙන චරිත කරනවා.

**නිතර නිතර පිටරට යනවා නේද?**

ඔව් ඔව්, සංගීත ප්‍රසංගවල ගී ගයන්න ආරාධනානම් බහුලයි, පුළුවන් විදියට ඒවාට යනවා.

# විජය නන්දසිරි දැන් සීයා කෙනෙක්



විජය නන්දසිරි මේ දවස්වල දරු සුරතල් බලනවා, ඒ තම දියණිය නවාංජනාගේ. ඕස්ට්‍රේලියාවේ පදිංචි වෙලා ඉන්න ශ්‍රී ලාංකික තරුණයෙක් සමග තමයි නවාංජනා විවාහ වුනේ. නවාංජනා දැන් අම්මා කෙනෙක්. මේ ටිකේ ඉන්නෙ ඇගේ මහගෙදර. ඒ කියන්නේ ගල්කිස්සෙ. ඉතින් දැන් විජය - දේවිකා යුවළ හුගාක් ආසාවෙන් නවාංජනාගේ දරුවා සමග කාලය ගත කරනවා කියලා තමයි ආරංචිය.

# කෑමට පෙර අත හෝදන්නෙ නැති නිසා පිං පොංට ලෙඩ නැහැලු



පුංචි කාලෙ ඉදලම අපිට දෙමව්පියෝ, ගුරුවරු පුරුදු කළේ කෑමට පෙර අත හෝදන්න කියලනෙ. ඒත් කවදාවත් කන්න කලින් අත හෝදන්නෙ නැති නළුවෙක් ඉන්නවා. ඒ රජිත හිරාන්(පිං පොං). රජිත කවදාවත් කෑමට පෙර අත හෝදලා පුරුදදක් නැහැයිලු, හැබැයි රජිතගේ වයිෆ් ඇන්ඩ්‍රියානා නම් කෑමට කලින් කීපවරක්ම දෑත් සෝදනවලු.

කෑමට පෙර අත් නොසෝදා කෑමෙන් ලෙඩ රෝග හැදෙනවා කියලා අපි දැනගත්තට, රජිත ප්‍රායෝගිකව විඳින ප්‍රතිඵලය නම් ඒකට විරුද්ධයි.'කෑමට පෙර අත නොසෝදන මට ජීවිතේට ලෙඩක් දුකක් හැදිලා නැහැ. හැබැයි මගේ වයිෆ් කොච්චර අත පය සෝදලා කෑවත් පොඩ්ඩ ඇත්නම් ලෙඩ වෙනවා'